ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන්,

**<u>ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් තනතුරුවලට පත් කිරීම</u>**

රාජ්‍ය අමාත්‍යාංශ අහෝසි කිරීම හා තනතුරු යටපත්වීම් වැනි කරුණු හේතුවෙන් ඒ වනවිටත් ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I ශ්‍රේණියේ තනතුරුවලට විධිමත්ව පත්කර සිටි නිලධාරීන් කොටසකට තනතුරු අහිමිවීමක් සිදුවූ අතර ඒ හේතුවෙන් එම නිලධාරීන් අංක 02/2022(I) හා 2023.02.02 දිනැති රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛයේ විධිවිධාන අනුව ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I ශ්‍රේණියේ තනතුරුවල රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ආවරණ අනුමැතියට යටත්ව පූර්ණකාලීනව වැඩබැලීම සඳහා පත්කිරීම සිදුවිය.

02. ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I ශ්‍රේණියේ තනතුරුවලට ස්ථිර වශයෙන් පත්කර තිබූ නමුදු, ඉහත පරිදි වැඩබලන පත්වීම් ලබාදී ඇති නිලධාරීන් එම තනතුරුවලට විධිමත්ව පත්කිරීම සම්බන්ධයෙන් සලකා බැලීම සඳහා අදාල පහත සඳහන් ලිපි ලේඛන ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සමඟ 2024.03.28 දිනට ප්‍රථම යොමුකරන මෙන් කාරුණිකව දන්වමි.

I. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අදාළ ආයතනය සඳහා තනතුරු අනුමත කරන ලද ලේඛනයේ සහතික කරන ලද පිටපත (ආවරණ ලිපියද ඇතුළුව)
II. විධිමත්ව සම්පූර්ණ කරන ලද EST 12 ආකෘති පත්‍රය
III. නිලධරයා වැඩබැලීම සඳහා පත්කළ ලිපියේ සහතික කරන ලද පිටපත
IV. නිලධරයා රාජකාරි සඳහා වාර්තා කළ ලිපියේ සහතික කරන ලද පිටපත
V. අදාළ තනතුර සඳහා ස්ථිරව පත්කිරීමට නිලධරයාගේ ඉල්ලීම් ලිපියේ සහතික කරන ලද පිටපත
VI. නිලධරයා ශ්‍රී ලං.ග.සේ. I ශ්‍රේණියට උසස් කල ලිපියේ සහතික කරන ලද පිටපත

පී.ඩබ්ලිව්.රාජපක්ෂ
අතිරේක ලේකම් (රාජ්‍ය පරිපාලන)
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට

දුරකතන : 011-2696211-13 (දිගුව 132/218) / 011-2698672
ෆැක්ස් : 011-2693304
විද්‍යුත් ලිපිනය : d.acsd.pubad@gmail.com